# ඇන්ටන් බාලසිංහම්ගේ ෆෙඩරල් යෝජනාව

**සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න**




විමුක්ති කොටි සංවිධානයත් ලංකා රජයත් අතරෙහි 2002 වසරේ පෙබරවාරි මාසයේ සටන් විරාම ගිවිසුම අත්සන් තැබූ පසුව කිලිනොච්චි නගරය කොළඹ නගරයට සමාන වන දේශපාලන අග නගරයක්ය යනුවෙන් දේශපාලන විශ්ලේෂකයන් විසින් හඳුන්වනු ලබන තරමට නොයෙක් දේ එහි සිදු විය. ඒවායින් පළමු පියවර ලෙස විමුක්ති කොටි සංවිධානයේ දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම් සහ ඔහුගේ බිරිඳ එංගලන්තයෙහි සිට මාල දිවයිනට පැමිණ එහි සිට කුලියට ගත් 'Maldive air tAxi' මාර්ගයෙන් ඉරණෛමඩු ජලාශ්‍රයට ගොඩ බැස්සාහ.

ඔවුන්ව පිළිගැනීම සඳහා ප්‍රභාකරන් නායකතුමා ද ඔහුගේ බිරිඳ මදිවදනි ද සංවිධානයෙහි වැදගත් තනතුරු දරන්නෝ ද සෙන්පතිවරු ද වගකීම් භාර නිලධාරිවරු ද පැමිණියහ. කාන්තා අංශයෙහි සෙන්පති තනතුරු දැරූ කර්නල් විදූෂා, කර්නල් දුර්ගා යන අය සමඟ මම ද එහි ගියෙමි. එදින හැමෝගේම මුහුණු සතුටින් පිරී තිබුණි. සුපුරුදු නිල ඇඳුම වෙනුවට ළා නිල් පාට සහිතව ඔහු වෙනුවෙන් විශේෂයෙන්ම නිර්මාණය කළ 'සපාරි' වර්ගයෙහි ඇඳුමකින් සැරසී සැහැල්ලු මනසින් සියලු දෙනා සමඟම සුහඳව කතාබහේ යෙදී සිටි නායකතුමාව දුටු හැමෝගේම හිතවල මහත් සැනසීමක් සහ විශ්වාසයක් ඇති විය.

දේශපාලන අංශයෙහි භාරකරු තමිල්ච්චල්වන්, මුහුදු කොටි විශේෂ සෙන්පති සුසෙ, මූල්‍ය අංශයෙහි භාරකරු තමිළේන්දි යන අය සුළං පිරවූ ප්ලාස්ටික් බෝට්ටුවකින් ගොස් දේශපාලන උපදේශක සහ ඔහුගේ බිරිඳව කැඳවාගෙන ආහ. වකුගඩු රෝගය හේතුවෙන් මහත් පීඩාවට පත්ව මරණය සමඟ සටන් කරමින් සිටියදී අනතුරුදායක මුහුදු මාර්ගයෙන් මෙම රටෙන් පිටත්ව ගොස් තම වකුගඩු සැත්කම අවසන් කර නැවතත් සාම කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා කිලිනොච්චි ඉරණෛමඩු වැවට පැමිණ සිටි දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම්ට බෝට්ටුවෙන් බැසීමට ප්‍රභාකරන් නායකතුමා අත දුන්නේය.

දිගු කාලයක් වෙන්ව සිටි පවුලක් නැවත එක් වූවා සේ වූ එම පරිසරය සතුටු සාමීචිවලින්, සුවදුක් විචාරයන්ගෙන් පිරී තිබුණි. පැමිණ සිටි සියලු දෙනාම ඇන්ටන් බාලසිංහම් සහ ඔහුගේ බිරිඳ හොඳින් දන්නා හඳුනන සහ යහපත් සමීප ඇසුරක් ඇති අය වූහ. එකම එක වතාවක් පමණක් හමුවූ සටන්කාමියෙකුව පවා මතකයේ රඳවාගෙන උරහිසට තට්ටුකර සුව දුක් විමසීම ඔවුන්ගේ ලක්ෂණයයි. එහෙයින් සාමාන්‍ය මට්ටමේ සටන්කාමියෙකුට පවා ඔවුන් පිළිබඳව වූයේ මහත් සෙනෙහසකි.

මම පළමු වතාවට ඇන්ටන් බාලසිංහම්ව සහ ඔහුගේ බිරිඳ හමුවූයේ 1993 වසරේ ඔවුන්ගේ නිවෙසේ දීය. එවක මම 'සුහන්දිර පරවෙහල්' පුවත්පතට දේශපාලනික ලිපියක් ලියුවෙමි. කවුරුන් හෝ ලොකු කෙනෙකුට දී එහි හරි වැරැදි බලා ගත යුතු යැයි මම මගේ මිතුරිය වූ මලෛමහල් සමඟ පැවසුවෙමි. ඒ අනුව මාව ඇන්ටන් බාලසිංහම්ගේ නිවෙසට කැඳවාගෙන යනු ලැබුවේ ඇය විසින්ය.

ඔහු මලෛමහල්ව දැන සිටි හෙයින් මගේ නම ඇසුවේ ය. ඒ වන විට මගේ නම චන්ද්‍රිකා විය. එම නම ඇසූ විටම ඔහු තුළ සිනහවක් පහළ විය. 'චන්ද්‍රිකා මැතිනිය, කොහොමද සුව දුක්? කොහේද වැඩ කරන්නේ?' යැයි ඔහු ඇසුවේය. මම ඒ වන තෙක් මාධ්‍යවලින් පමණක් දැන සිටි සංවිධානයේ වැදගත් කෙනෙකු සමඟ කතාබහ කරමින් ඉන්නේය යන්න සිතන විට හිතට මහත් තැති ගැනීමක් ඇති විය. ඔහුගේ බිරිඳ රසවත් තේ එකක් දී සිනාමුසුව අප අසල අසුන් ගත්තාය. ''කෑවද? මොනවද කෑවේ? යැයි ඇය විමසුවාය. සුදු ජාතික කාන්තාවක් වූ ඇය දෙමළ භාෂාව තමන්ට හැකි තරම් හොඳින් උච්චාරණය කර කතා කිරීමට උත්සාහ කිරීම මම විමතියෙන් යුතුව නිරීක්ෂණය කළෙමි.

මම රැගෙන ගිය ලිපිය ''හයියෙන් කියවන්න'' යැයි බාලසිංහම් මහතා පැවසුවේය. දෑස් වසාගෙන සියල්ලම අසා සිටි ඔහු 'අර ඡේදය අයින් කරන්ඩ. මේ ඡේදය ටිකක් කල්පනා කරලා ආයේ ලියන්ඩ. වරදක් නෑ. මෙහෙම තමයි ලියල ලියල පුරුදු වෙන්ඩ ඕනෑ. දක්ෂ ළමයෙක්.

සෑහෙන පොත් කියවන්ඩ ඕනේ. අයිසේ මම කියන එක තේරෙනවද?' යැයි ඔහු තමන්ට සුදුරුදු ශෛලියෙන් අවවාද දුන්නේය. මම වේගයෙන් හිස සෙලවූවෙමි. ඇන්ටන් බාලසිංහම් සහ ඇඩෙල් බාලසිංහම් සමඟ සටන්කාමී කාන්තාවෝ බොහෝ දෙනෙක් කිසියම් පුද්ලික ළෙන්ගතුකමකින් සමීපව ආශ්‍රය කළ බව මට පැවසිය හැකිය. ඇඩෙල් සුදු ජාතික කාන්තාවක් වුවත් ඉතාමත් සරලව චාම්ව සියලු දෙනා ඇසුරු කළාය.

සටන් විරාම කටයුතුවල ආරම්භක පියවර ලෙස කිලිනොච්චියෙහි සාම ලේකම් කාර්යාලයක් ස්ථාපිත කළේය. ප්‍රවාහන මාර්ග විවෘත විය. කිලිනොච්චියෙහි පැවැත්වූ ජාත්‍යන්තර ජනමාධ්‍ය හමුව මුස්ලිම් සහ කඳුරට දේශපාලන නායකයන් ඇතුළුව විවිධ පාර්ශ්වයන්ගේ දේශපාලන කණ්ඩයම් හමුවීම යනාදී වශයෙන් කොටි සංවිධානයේ නායකත්වය තීව්‍ර ලෙසින් දේශ පාලන කටයුතුවල සෘජුවම නිමග්නවීමට පටන් ගත්තේය.

යාපනයෙහි අවතැන්වීම ක්‍රමෝපායික පසු බැසීමක් යැයි සංවිධානය පැවසුවත් එය කොටි සංවිධානය මුහුණ දුන් මහත් පරාජයක් විය. එයට පසුව වන්නියේ සිදුවූ දරුණු සටන්වල දී කොටි සංවිධානය ලැබූ ජයග්‍රහණ මෙවැනි දේශ පාලන වාතාවරණයක ප්‍රතිඵලයක් තුළින් ඇති වූ ජයග්‍රහණ යැයි යන ආඩම්බරය කොටින් තුළ පිරී පැවැතුණි. ලංකාවේ දේශපාලන සහ හමුදාමය ශක්තියෙන් යුතු බලවත්ව සිටි කොටි සංවිධානය ජාත්‍යන්තර අනුග්‍රහය යටතේ පැවැත් වූ සාම සාකච්ඡා මේසයෙහි තම කේවල් කිරීමේ දක්ෂතාව හැකි උපරිම අන්දමින් භාවිත කළ යුතුය යන්න පිළිබඳව දැඩි අධිෂ්ඨානයක උන්නේය.

2002 වසරේදී සටන් විරාම ගිවිසුම අස්සන් කළ ප්‍රභාකරන් නායකතුමා දේශපාලන අංශයෙහි භාරකරු තමිල් චෙල්වන් සමඟ පැවසූ කරුණ ඔහු අනෙකුත් භාරකරුවන් සමඟත් පවසා ඇත. 'අස්සන් කළා. දැන් තමයි ප්‍රශ්නවලට මුහුණ දෙන්නට ඕනෑ. සංවිධානේ පිරිස් බලය වැඩි කරන්ඩ ඕනෑ. රජයේ පාලන ප්‍රදේශවල ඉන්න ජනතාවට කොටි සංවිධානේ හමුදාමය ශක්තිය, වැදගත්කම පැහැදිලි කරලා දීලා තරුණ කරුණියන්ව අරගලයට එක් රැස් කර ගන්ඩ ඕනෑ.' කියලා නායකතුමා කිව්වා. අපි මේ විරාමය ප්‍රයෝජනයට අර ගෙන දැඩි ලෙසින් බලය වැඩි කර ගන්ඩ ඕනෑ. පටන් ගත්ත කාලෙදි අපි ළඟ පිරිස් බලය තිබුණා. ආයුධයි අඩුපාඩුවක්ව තිබුණේ. දැන් අපිට අවශ්‍ය තරමට ආයුධ තියනවා. පිරිස් බලය මදි. අපි තමයි ඒ පිරිස් බලය රැස් කරලා දෙන්ඩ ඕනෑ. සාම සාකච්ඡා තියන්නේ බාහිර ලෝකෙට මිසක් අපිට නොවෙයි කියන එක තේරුම් අරගෙන ඔයාලා වැඩ කරන්ඩ ඕනෑ.' යැයි ඔහු කීවේය.

ලංකා රජය සහ කොටි සංවිධානය අතරේ වූ සටන් විරාම ගිවිසුම විසින් දීර්ඝ යුද්ධයකට පසුව සාමයත් සැනසීමත් ජනයාට ලබා දී තිබුණත්, ස්ථිර සාමයක් ඇතිවෙතැයි යන දැඩි විශ්වාසය ඇති කර තිබුණේ නැත. මක්නිසාද යත් ආණ්ඩුව සහ කොටි යන දෙපාර්ශ්වයම පිරිසිඳු හදවතින් අවංකවම සාම ක්‍රියාදාමයන්හි යෙදෙන්නේ නැති බව අතීත අත්දැකීම්වලින් ජනතාව හොඳින් තේරුම් ගෙන සිටි බැවිනි. එහෙයින් ඉඳහිට ලැබෙන අවකාශය ප්‍රයෝජනයට ගෙන පීඩාවට පත් තම ජීවිතය යන්තමින් හෝ යහපත් අතට හරවාගත යුතුය යන්න ඔවුන්ගේ උත්සාහය විය. අනවරතයෙන් පැවැති යුද්ධය හේතුවෙන් විනාශ වූ ගේ දොර වෙළෙඳ සැල් ආදිය ජනතාව තම ස්වයං උත්සාහයෙන් නැවත ගොඩනඟන්නට විය.

'ආයෝ කවදද පටන්ගන්ඩ ලෑස්ති ?'
'පටන් ගන්ඩ ඉස්සෙල්ලා අපිටත් කියන්ඩ.'
'අවුරුදු පහකට රැදී තියෙන විදිහට සිමෙන්ති මිශ්‍රණය කවලම් කරලා ගොඩ නඟපුවම ඇති.'.

යන ආකල්පයන් සමඟින් ජනතාව සාම ක්‍රියාදාමය නිරීක්ෂණය කළේය.

බැංකොක් ජිනීවා ටෝකියෝ යනාදි වශයෙන් දේශාලනික ව සහ ආර්ථික වශයෙන් වැදගත් වන අග නගරයන්හි සාම සාකච්ඡා පැවැත්විය. සාම සාකච්ඡා ප්‍රධාන අදියර දෙකක් ලෙසින් පැවැත්විය යුතුය යනුවෙන් කොටි සැලැසුම් කළහ. පළමුව ජනතාවගේ දෛනික ප්‍රශ්න පිළිබඳව එකඟතාවන්ට පැමිණීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය. එය මූලික දේශපාලන කරුණු පිළිබඳව සාකච්ඡා කළ හැකි අදියර දක්වා සාම සාකච්ඡා රැගෙන යනු ඇතැයි යන්නෙහි කොටි සංවිධානය දැඩි තීරණයක උන්නේය. එහෙත් ආණ්ඩුව ජනතාවගේ දෛනික ප්‍රහ්න ගැන සාකච්ඡා කරන ගමන්ම දේශපාලන විසඳුමකට ද පැමිණිය යුතු බවට, නැතහොත් විසඳුමක් පැටවීමට උනන්දුවක් දැක්වූවේය. පෙඩරල් ක්‍රමයට සකස් වූ විසඳුමක් පිළිබඳව අවධානය යොමු කළ හැකිය යන අදහස කොටින්ගේ ප්‍රධාන ප්‍රකාශක ඇන්ටන් බාලසිංහම් විසින් ඉදිරිපත් කරන ලද්දේ මෙම තත්ත්වය තුළය.

කොටින්ගේ සංඥාව ආයුධයක් ලෙසින් ගෙන බටහිර ලෝකය සහ ලංකා රජය කොටින්ව තමන්ගේ මාර්ගයට ගෙන ඒමේ ක්‍රමෝපායික කටයුතුවල නිරත වන්නට විය. තම අත්පවුරෙන් ගිලිහී යන දේශ පාලනික කරුණු හේතුවෙන් ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික වටකිරීම් දැලකට තමන් අසු වී සිටින බව තේරුම් ගත් නායකතුමා තම සුපුරුදු දැඩි බව සමඟින් ලංකා රජය සහ බටහිර ලෝකය අතෘප්තිමත් කළ හැකි තීරණ ගැනීමට පටන් ගත්තේය. සාම ගීතිකාවේ හඬ ටිකින් ටික පහළ වැටෙන්නට විය.

ලංකා රජය සමඟ සාම සාකච්ඡා පැවැත්වීමට තෙවැනි පාර්ශ්වයක මැදිහත් වීම අවශ්‍ය ය යනුවෙන් වූ විමුක්ති කොටි සංවිධානයේ ඉල්ලීමට අනුව ජාත්‍යන්තර ප්‍රජාවේ අනුග්‍රහය සහිත ව නෝර්වේ රජය මැදිහත්කරු ලෙසින් ක්‍රියා කිරීමට ඉදිරිපත් විය. බටහිර රටවල නියෝජිතයන්ගෙන් යුතු සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමක් ද ඇති කළේය. ඒ අනුව තෙවැනි පාර්ශ්වයක් ලෙසින් කටයුතු කරමින් සිටි ජාත්‍යන්තර ප්‍රජාව සාම ක්‍රියා සැළැස්ම ජයග්‍රාහීව ඉදිරියට ගෙන යාම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මූලධර්ම මත ස්වීය වූ නවීන ප්‍රවේශයන් අනුව තම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්නට විය.

එනම් යුද්ධයට සම්බන්ධව සිටි දෙපාර්ශ්වය සමඟම පණිවිඩ හුවමාරුකරුවෙකු ලෙස කටයුතු කිරීම, ඔවුන්ගේ අභිමතාර්ථයන් සහ අවශ්‍යතා ඉටු කිරීම, සාකච්ඡා මේසයෙහි මැදිහත්කරු ලෙස අනුග්‍රහ දැක්වීම යනාදියට පමණක් සීමා නොවී යුද්ධයට සම්බන්ධ දෙපාර්ශ්වයෙහි ජනතාව අතරෙහිපවා එකඟතාවක් ඇති කිරීමට හැකි වන අයුරින් කටයුතු කිරීමට උනන්දු විය. උදාහරණයක් ලෙසින් සිංහල දෙමළ සහ මුස්ලිම් ජනතාව අතරෙහි සම්බන්ධතාව ඇති කිරීම, කාන්තා සංවිධාන අතරෙහි සම්බන්ධතා ගොඩනැංවීම, ශිෂ්‍යයන් අතරෙහි අධ්‍යාපන සම්බන්ධතා ඇති කිරීම යනාදී වශයෙන් වෙන්ව සිටි සියලුම ප්‍රජාවන් ඒකාබද්ධ කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම මඟින් ඇතිවිය හැකි ජනවාර්ගික සම්බන්ධාතවන් ද සමාජීය සම්බන්ධාවන් ද ප්‍රශ්නයෙහි උග්‍ර බව අඩු කර සාමකාමී විසඳුමක අවශ්‍යතාව කරා සියලු පාර්ශ්වයන්ම ඇදගෙන යනු ඇතැයි යන්න එහි සූත්‍රය විය.